මහනුවර ඇසළ පෙරහැර භාරය - 2025

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2025 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත භාරයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i.) | මුදල් රෙගුලාසි 137 හා 138 | සමාලෝචිත වර්ෂයේ ඇසළ පෙරහැරේ ඉන්ධන,කෙටි සංග්‍රහ හා අනෙකුත් වියදම් සඳහා ලබාගත් රු.80,000 ට අදාල අත්තිකාරම් පියවීමට අදාල ගෙවීම් වවුචර් 02 ක් අනුමත කිරීමකින් හා සහතික කිරීමෙන් තොරවද රු.3,000,000 ක් වටිනා ගෙවීම් වවුචරයක් සහතික කිරීමෙන් තොරවද ගෙවීම්කර තිබුණි. | මේ වනවිට නිලධාරින්ගෙන් අත්සන් ලබාගෙන සහතික කිරීම සිදුකර ඇති බව. | මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ii.) | 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.1 (අ) ඡේදය | අරමුදලේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය එහි පාලන අධිකාරිය සහ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු | ඇසළ පෙරහැර භාරය නිශ්චිත රේඛීය අමාත්‍යාංශයක් යටතට අයත් වන බවක් පනතේ සඳහන් නොවන බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් ලබාගත නොහැකි බවත්, කිසිම අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවකින් ඇසළ පෙරහැර භාරය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ සිදු නොවන බවත්, එබැවින් ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 උපදෙස් අනුව අදාළ අනුමැතිය ලබාගත යුතු වීම. |

| | |
|---|---|
| කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ රු. 21,198,125 ක වියදම් දරා තිබුණි. | ඇස්තමේන්තුව ඇසළ පෙරහැර භාරය විසින් අනුමත කිරීමට කටයුතු කර ඒ අනුව අදාළ වියදම් දරා ඇති බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,867,245 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,622,410 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,244,835 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මේ සඳහා ආසන පැනවීමේ ආදායම්වල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙරහැර සඳහා සහභාගී වූ විශිෂ්ට නර්තන ශිල්පීන් ඇගයීම සඳහා රු.342,000 ක් වැයකර වෙස් ඇඳුම් කට්ටල 06 ක් ඇණවුම් කර 2025 සැප්තැම්බර් මස 18 දින ලැබී ඇතත් විගණිත 2026 මාර්තු 24 දින වන විටත් ඒවා අවශ්‍ය ශිල්පීන් වෙත නිකුත් නොකර ඌන උපයෝජිතව පැවතුණි. | වෙස් කට්ටල දෙක දැනට පෙරහැර භාරයේ ආරක්ෂිතව පවතින බවත්,එය ලබා දිමට නියමිත ශිල්පීන් දෙදෙනා නම් කිරිමේ ගැටලුවක් පවතින බැවින් මෙතෙක් ලබා දී නොමැති බවත් ඉදිරියේ දි පවත්වනු ලබන පළමු භාරයේ රැස්වීමේදී මේ පිළිබඳ තිරණයක් ලබාගෙන නිකුත් කිරීමට කටයුතු සිදු කරන බව. | භාරයේ අරමුණු අනුව කටයුතු කළ යුතුවීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2026 මාර්තු 04 දින මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි 877(2)(ඉ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය | ඇසළ පෙරහැර භාරය නිශ්චිත රේඛීය අමාත්‍යාංශයක් යටතට අයත්වන බවක් පනතේ සඳහන් නොවන නිසා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් ලබාගත නොහැකි බැවින් ඒ පිළිබඳව භාරයේ ඉදිරි රැස්වීමක දී සාකච්ඡා කර අදාළ අංශ දැනුවත් කර ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය හා පරිපාලන වගවීම නියමිත පරිදි ඉටු කළ යුතුය. |

වාර්තා හා කාර්ය සාධන වාර්තා විගණනය කර ලබා දෙන විගණන වාර්තා ද ඇතුළත් කරමින් වාර්ෂික කාර්ය සාධන වාර්තාව නියමිත විධිවිධාන යටතේ භාෂාත්‍රයන්ම සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වුවද, ඉකුත් වර්ෂයේ වාර්තාව 2026 මාර්තු 24 දින වනවිටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.